# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

**India's National Spiritual Newspaper**

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

**Editor : S. SAM SELVA RAJ**

16 Languages

Vol. XVII | APRIL 2023 | Issue No. 05


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 113:1-9)**

01. ස්වාමීන්ට ප්‍රශංසාකරව්, ස්වාමීන්ගේ මෙහෙකරුවෙනි, ප්‍රශංසාකරව්, ස්වාමීන්ගේ නාමයට ප්‍රශංසාකරව්.

02. මෙතැන් පටන් සදාකල් ස්වාමීන්ගේ නාමයට ප්‍රශංසා වේවා,

03. නැගෙනහිර පටන් බස්නාහිර දක්වා ස්වාමීන්ගේ නාමයට ප්‍රශංසා කටයුතුය.

04. ස්වාමීන්වහන්සේගේ සියලු ජාතීන්ට උසස්ව සිටිනසේක, උන්වහන්සේගේ තේජස ස්වර්ගවලට වඩා උසස්ය.

05. උසස් තැන්හි වැඩ හිඳින්නාවූ, ස්වර්ගයේද පෘථිවියේද තිබෙන දේ

06. බලන්ට තමන්ම යටත්වෙන්නාවූ අපේ දෙවිවූ ස්වාමීන්ට සමාන කවුද?

07. අධිපතීන් සමඟ, එනම්, ස්වකීය සෙනඟගේ අධිපතීන් සමඟ. හිඳුවන පිණිස

08. උන්වහන්සේ දුප්පතා ධූලියෙන් නැගුටුවනසේක, දිළිඳා කසල ගොඩින් ඔසවනසේක.

09. උන්වහන්සේ වඳ ස්ත්‍රීය දරුවන් ඇති ගෙය රක්නාවූ ප්‍රීතිමත් මවෙක් කරවනසේක, ස්වාමීන්ට ප්‍රශංසාකරව්.

# සැබෑ පිබිදීම REAL REVIVAL!

**(පාස්ටර් සැම් සෙල්ව රාජ්ගේ පණිවිඩයකි)**

කිතුණුවන් අතර නිතරම භාවිතා කරන්නාවූ වචනයක් වන්නේ 'පිබිදීමයි', මෙම පදය සම්බන්ධ බයිබලයෙන් කරුණු සෙවීමට මා උත්සාහ කලද එවැනි පදයක මා හට සොයා ගැනීමට හැකි නොවුනි. 'පිබිදීම' යන පදය තුළ මහත් වූ අර්ථයේ ගැබ්වී ඇත. ඉන්දියාව තුළ ආත්මික රැස්වීම් පවත්වන අවස්ථාවන් වලදී ඔවුන් ඒවා සාමාන්‍යයෙන් හඳුන්වන්නේ ශුභාරංචි රැස්වීම් මාලාවන්, ආත්මික පිබිදීමේ රැස්වීම් ලෙස හඳුන්වති. සමහර රටවල්හි මෙවැනි රැස්වීම් පිබිදීම කියා හඳුන්වති. අද දිනදී දෙවියන්වහන්සේ කථා කරන්නාවූ අන්තිම වර්ෂාව පිළිබඳවම ඔබ හා සමඟ බෙදා ගැනීමට කැමැත්තෙමි. එනම්, දෙවියන්වහන්සේ නැවත දෙන්නාවූ ආත්මික පිබිදීමයි.

පිබිදීම යන පදය ලතින් භාෂාවේ 'රිවයිවල්' (Revivall) ලෙස ගත් දෙයකි. ඉංග්‍රීසි භාෂාවෙන් එහි තේරුම නම්, 'නැවත අවධි කිරීමයි' එනම්, තමාගේ ජීවිතයට 'නව ජීවිතයක්' ලබා ගැනීමයි. එය මළවුන්ගෙන් නැගිටීම නොවන නමුත් මැරි සිටි පුද්ගලයෙකුට නැවත ප්‍රාණය දීමකි. එය මෙලෙස විග්‍රහකිරීමට හැකිය. හෘර්දයාබාධයක් සෑදුන පුද්ගලයෙකුගේ හදවත එක් ක්ෂණයකින් නැවතීමට හැකිය. නමුත් ඒ මොහොතේම ඔහුට හදිසි ප්‍රතිකාර ලබා දුන් විටදී නැවත එය ක්‍රියාත්මක වීමට හැකිය. අපගේ ජීවිතයද නැවත ජීවනයට ගෙන ඒම 'පිබිදීම' කියා හැඳින්විය හැකිය.

3 වෙනි පිටුවට ...


**Echo of His Call**

***Christian YouTube Channel!***



**An opportunity to pray with Pr. S. Sam Selva Raj!**

Message, prayer in 5 minutes!!


**English, Hindi, Tamil & Telugu**

Every day – 5.00 A.M.

**Tamil Sunday Service – 8.30 A.M.**

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

REACHING NATIONS



*from your dearly beloved brother...*

# කැඳවීමේ ප්‍රතිරාවය



> "…. මමද පොළොවේ උසස්ථාන මතුයෙහි නැගීයන්ට නුඹට සලස්වා, නුඹේ පියවූ යාකෝබ්ගේ උරුමයෙන් නුඹ පෝෂණය කරන්නෙමි…." (යෙසායා 58:14)

**ස්වාමීන්වහන්සේ තුළ ප්‍රේමවන්තයෙනි,**

**බොහෝ යහපත් වූ දේ ඔබ වෙත පැමිණේනු ඇත. සතුටු සිතින් සිටින්න.**

අද ලෝකයේ ශුභාරංචිය ඉතාම සීඝ්‍රයෙන් පැතිර යයි. අද අප පමණක් නොව විවිධ සභාවන් කිතුණු සංවිධාන මේ සඳහා ක්‍රියාත්මක වෙමින් දේව සේවය උදෙසාත් මනුෂ්‍යයන් පාපයෙන් ගැලවීමටත් දිළිඳුකමෙන් සහ රෝගයෙන් මුදන්නටත් ඉතා කඩිනමින් සේවය කරනු ඇත. මෙවැනි අය උදෙසා අප නොකඩවාම යාච්ඤා කල යුතුය. අපට හැකි ලෙස ඔවුන්ට උපකාර කල යුතුය. අපට ඇති සියලු වාද භේද අතහැර අප සියලුදෙනාම එකමුතු වී මේ ශුභාරංචිය ප්‍රකාශ කිරීම උදෙසා ක්‍රියාකල යුතුය.

ජනවාරි මස 26 වන දින නෙහෙමියා බයිබල් විද්‍යාලේ ඉගෙනගත් පාස්ටර් රාජමිනි සහ ඔහුගේ භාර්යාව වූ පාස්ටර් ආර්. විමල් යන දෙදෙනාව පාලවේර්කාඩු යන ස්ථානයේදී දේවගැතිවරුන් ලෙස ආලේප කලේය. මෙම දේව මෙහෙයඉතාම ආශිර්වාදමත් දේව මෙහෙයකි. මෙම සේවාවන් උදෙසා



*Dedication of new Church*

අප නොකඩවාම යාච්ඤා කරමු. චෙන්නෙයි අවට ඇති සෑම ගම්මාන වලම සියලු සභාවන් තවත් දියුණුවෙන්නය කියා අප යාච්ඤා කරමු. ඉන්දියාව තුළ ගම්මාන 70000 ක් තිබෙන බව අපි දනිමු. අප කෙසේ හෝ මේ සෑම ගම්මානයකටම ශුභාරංචිය ගෙන යා යුතුය.

### කැඳවීමේ ප්‍රතිරාවය පවුලේ වගකීම්

දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ඉතා කඩිනමින් වැඩ කලාවූ අන් අයට මගපෙන්වූ දෙවියන්වහන්සේගේ දාසයන් අද විවිධ දුක් කම්කටලු තුළින් ගමන් කරයි. මෙවැනි අයගේ පුද්ගලික උවමනාවන් අප සැපයිය යුතුය. යක්ෂයා ඔවුන්ට ශාරීරික ලෙසත් ආර්ථික ලෙසත්



*Echo of His Call key leaders*

**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.

MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.

ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager

EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Dr. A. Richard Samuel, M.A., Ph.D.
Rev. Dr. K.R. Rajasekaran

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

CORE LEADERS
Bro. K. Puratchivendan
Dr. Rabinder Boaz, M.S.
Bro. A. Edward Durai
Bro. A. Alvin
Bro. K. Abraham
Sis. Dhanalakshmi Chinnaiah

E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

YOUTUBE CHANNEL
Echo of His Call



*Servant of God engaged in evangelism*

පහර දෙයි. ඔබ දන්නාවූ සේවකයින් සිටී නම් ඔවුන්ට උපකාර කරන්න. ශාරීරික ලෙස උදවු කරන්න. අද දේව දාසයින්ට බොහෝ මුදල් තිබුනත් ඔවුන් ඔවුන්ගේ පටන්ගැන්ම අමතක කර දමා ඔවුන් ගැනම පමණක් සිතමින් ඉඩම්කඩම් මිලදී ගනිමින් සේවය නමින් විශාල ගොඩනැගිලි ඉදි කරමින් තමා වෙනුවෙන්ම ජීවත් වෙති. දුක් කඳුලු මාර්ගයන් තුළින් ගමන් කරන්නාවූ සේවකයින්ට උදවු උපකාර නොකරයි. මෙවැනි දුක් වලින් ගමන් කරන්නාවූ පවුල් වලට ඔබගේ උපකාරය ලබා දෙන්න. දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

අද බොහෝ දේව දාසයින් කෝටි ගණන් සෙනග නිරයට ගමන් කරනු ඇත. මේ ගැන අද දේව දාසයින්ට කිසිම උනන්දුවක් නැත. සමහරු යේසුස් වහන්සේගේ දෙවන පැමිණීම ගැන දේශනා කරන නමුත් ඔවුන්ගේ පුද්ගලික ජීවිතයෙහි විශාල ගොඩනැගිලි ඉඩම්කඩම් ගැන සැලසුම් කර බොහෝ මුදල්මය සැලසුම් දමා ක්‍රියා කරති. මෙය අවශ්‍යද? මෙය මුලාවීමක් නොවේද? මේ ගැන සිතා බලන්න. දුප්පත් දේව දාසයින්ට උපකාර කරන්න. ඔවුන් බොහෝ දුක් මාර්ගයන් තුළින් ගමන් කරන බැවින් ඔවුන් උදෙසා යමක් කරන්න.

බොහෝ දේව දාසයින්ට බයිසිකලයක්වත් නැත. ගම්මාන වල පිහිටි සමහර දේවස්ථාන ගොඩනැගිලි වල වහලක් නැත. නිසි ලෙස පොළොවේ බිම සාදා නැත. සමහර අයට කෑම වෙලාව සපයා ගැනීමටද නොහැකිය. මේ අය ගැන අප සිතිය යුතුය. සමහර අය සේවය ගැන නොසිතා ව්‍යාපාර කටයුතුවල නිරතව සිටී. මෙවැනි අය ගැන අවධානය යොමු කරන්න. අපගේ අරමුණ විය යුත්තේ දුක් කඳුළු තුළින් ගමන් කරන්නාවූ දේව දාසයින්ට උපකාර කිරීමයි. අපගේ නෙහෙමියා බයිබල් විදුහලේ තත්වය උසස් කරමින් තවත් බොහෝ දේව දාසයින් බිහි කරන පිණිස BTH උපාධි පාඨමාලාවක්ද අපි ආරම්භ කරමු. BTH පාඨමාලාව අප Online හරහා කිරීමට බලාපොරොත්තු වෙමු. මේ සම්බන්ධව ඔබගේ සභාවන් වල දැනුවත් කර ඒ සඳහා යොමු වීමට කැමති අයව අපගේ බයිබල් විදුහලට යොමු කරන්න. ඔබගේ අදහස් හා යෝජනා අපි බලාපොරොත්තු වෙමු. ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්**

(+91) 98412 71858 / 98410 71858,

E.mail : samselvaraj333@gmail.com

*1 පිටුවෙන්....*

මා කැඳවීම ප්‍රතිරාවය සේවයෙහි යෙදී සිටී මිය ගියාවූ දේවගැති එස්. දේවදාසන් තුමාගේ සේවය තුළින් බිහිවූ ගෝලයෙකි. මෙම පිබිදීම පැමිණෙන්නේ අප ශුද්ධාත්මයාණන්වහන්සේට මුළුමනින්ම කැපවූ විටදී ශුද්ධාත්මයාණන්වහන්සේගේ ක්‍රියා කිරීම අපගේ තුළ ක්‍රියාත්මක වීමෙනි. මෙය මාංෂික ක්‍රියාවක් නොව මෙය ස්වාමීන්වහන්සේ විසින් අපට ලබා දෙන්නාවූ දෙයකි. දෙවියන්වහන්සේව විශ්වාස නොකරන්නාවූ අය තුළ මෙම පිබිදීම හටගන්නේ නැත.

පිබිදීම කරණකොටගෙන සිදුවෙනුයේ, ක්ලාන්තයට පත්වී සිටින ශුද්ධවන්තයින් ස්වාමීන්වහන්සේගේ පියාපත් යටතට නැවත පැමිණීමයි, පසුබට වූ අය නැවත නිසි මාවතට පැමිණීමයි. පිබිදීම කරණකොටගෙන දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය අපගේ ජාතියට හා සමාජයට ගෙනයාමට හැකියාව ගෙනෙයි, දේව රාජ්‍යය අමතක කර තිබෙන්නාවූ අයව නැවත අවධි කරමින් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට ගෙන යාමයි.

පිබිදීම හටගැනීමට නම් අප කරන්නාවූ සාමානය යාච්ඤාව ප්‍රමාණවත් නොවෙයි. එසේනම් අප නොකඩවා යාච්ඤාවේ ජීවිතයකට ඇතුල්විය යුතුයි. මේ නවීන සමාජය තුළ පවතින අලුත් සංගීත භාණ්ඩ තුලින්වත් බොහෝ ශබ්ද තුළින්වත් නමස්කාර නර්තන වලින්වත් මෙම පිබිදීම හට නොගනී. මෙම පිබිදීම හටගැනීමට නම්. අපගේ දණ නැමිය යුතුයි. එවිට මහත්වූ පිබිදීම හට ගනු ඇත. වෙන්නෙයි නුවර බොහෝ සභාවන් තිබේ. නමුත් මෙහි සමහර පලාත් වල ශුභාරංචි පණිවිඩය ව්‍යාප්ත වී නොමැත.

අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවය තිබෙන්නාවූ ස්ථාන අවට ඇති බොහෝ පලාත් වලද ශුභාරංචිය ව්‍යාප්ත වී නොමැත. අප සිටින්නාවූ පලාතෙහි කිසි දිනක සභාවක් හෝ ශුභාරංචි රැස්වීමක් පැවැත්වීමට නොහැකිය යන තීරණයෙහි ස්ථිරව සිටියේය. නමුත් දෙවියන්වහන්සේ මෙම දුෂ්කර පලාතෙහි සේවයක් ආරම්භ කිරීමට උපකාර කර ඇත. මෙම මුළු පළාතම දෙවියන්වහන්සේට අත්පත් කර ගැනීමට අපට බොහෝ යාච්ඤාවේ වීරයන් අවශ්‍ය විය. අද අපගේ සභාව තුළින් මේ පලාතේ බොහෝ අයට සේවය කිරීමට අපට ඉඩ ප්‍රස්ථාව ලැබී ඇත. බොහෝ දෙනෙක් වතුර බෞතීස්මය ලබා ඇත. මෙම පලාතෙහි කිසියම් පිබිදීක් හටගෙන තිබේ.

මෙම පිබිදීම කරණකොටගෙන මෙම පලාතෙහි තිබූ චිත්‍රපට ශාලාවන්, එනම්, පෙරගන්, එල්පින්ස්ටන්, වෙලින්ටන්. සහ ස්ටාර් නැමති සියලුම චිත්‍රපට ශාලාවන් තුළින් ඇතිවූ සියලු අයහපත් දේවල බලපෑම නැවතී, එම සියලු ගොඩනැගිලි කඩා දාමා වෙනත් අලුත් ගොඩනැගිලි සාදා එහි ව්‍යාපාරයන් ආරම්භ කර ඇත. බොහෝ වැරදි ක්‍රියාවල නියුතුවූ දාමරිකයින් සහ විවිධ අපරාධ ක්‍රියා කලාවූ අය දෙවියන්වහන්සේව පිලිගෙන අද සභාව තුළ ස්වාමීන්වහන්සේ උදෙසා ජීවත් වෙති.

බොහෝ විට අප සිතනවා පිබිදීම තාවකාලිකද? එසේත් නොමැතිනම් එය ස්ථිර එකක්ද?

අද ලෝකයේ බොහෝ ස්ථාන වල මෙවැනි මහත්වූ පිබිදීම් හටගෙන ඇත. උදාහරණ ලෙස ස්කොට්ලන්තය සහ කොරියාව යන රටවල් අපට ගත හැකිය. ස්කොට්ලන්තයෙහි පිබිදීම උදෙසා ජෝන් නොක්ස් නොකඩවාම යාච්ඤා කලේය. එනිසා දෙවියන්වහන්සේ මහත්වූ පිබිදීමක් එම දේශයට එවනු ලැබීය. එහි ප්‍රතිඵලයක් ලෙස මිනිසුන් විශාල සංඛ්‍යාවක් යේසුස්වහන්සේව තම පුද්ගලික ගැලවුම්කරු ලෙස පිළිගනු ලැබීය. ජාතියක් ලෙස දියුණු වීමට පත්විය. ආර්ථිකය දියුණු විය. බොහෝ සභාවන් බිහිවිය. සෑම ස්ථානයකම ආත්මික ක්‍රියාවන් සහ යාච්ඤා රැස්වීම් පැවැත්විය. බොහෝ තරුණ තරුණියන් පසුතැවිලි වී ස්වාමීන්වහන්සේ වෙතට පැමිණි අතර ඔවුන්ගේ සුඛෝපභෝගී ජීවිත අත්හැර බොහෝ දෙනෙක් මිෂනාරී සේවයට ඇතුල් විය. මේ ක්‍රියාව නිසා ඉන්දියාව සහ තවත් බොහෝ රටවල් වල විශාල සභාවන් ආරම්භ විය. පාසැල් සහ රෝහල් ගොඩනැගිලි සෑදීම ආරම්භ විය. නමුත් අද ස්කොට්ලන්ඩ් දේශයේ තත්වය කුමක්ද?

මෑතකදී මා මෙම දේශයට ගිය විටදී මා ඉතාම මවිතයට පත්විය. මන්ද සභාවන් තුළ රැස්වූයේ ඉතාම සුළු පිරිසකි. බොහෝ අය යේසුස්වහන්සේව නොමැතිව ජීවත් වෙති. බොහෝ සභාවන් ගොඩනැගිලි වෙනත් අයට විකුණා ඇති අතර අද ඒවා තුළ රූප නමස්කාර කිරීමටත් නොයෙකුත් ව්‍යාපාරයන් සඳහාත් මත්පැන් ශාලාවන් ලෙසත් හා චිත්‍රපට ශාලාවන් ලෙස විවිධ වැරදි ක්‍රියාවන් සඳහා මෙම ස්ථාන පාවිච්චි කරති. එහෙත් මෙම සෑම ගොඩනැගිල්ලක් තුළම තවමත් සලකුණක් ලෙස කුරුසියක් තිබේ.

ස්කොට්ලන්ඩ් දේශයේ විශාල ශාලාවක දේව වචනය බෙදා ගැනීමට එක් දේව දාසයෙක් මා හට ආරාධනා කලේය. මෙම රැස්වීමට සහභාගි වන අය අතරින් කිසිවෙක්වත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැනවත්, ක්‍රිස්තියානිය ගැනවත් නොදන්නාවූ අය කියා ඔහු මට

6 වෙනි පිටුවට....

Pray for NEHEMIAH BIBLE
RESIDENTIAL / EVENING COLLEGE,
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders &
Senior Pastors for the past 53 years
Certificate in Theology : One year
Diploma in Theology : Two years
Qualification : 10th Standard & above
Rush for admission!
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

GREAT COMMISSION PARTNERS

ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**අප්‍රේ:19-** යාච්ඤා මැදිහත්කරුවන්, මහා ආඥාවේ මැදිහත්කරුවන් ඇතුළු අනෙක් සේවකයන් සහ ඔවුන්ගේ පවුල් වල අය ස්වාමීන්වහන්සේගේ කරුණාව ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:20-** භාෂා 16 කින් මුද්‍රණය වන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ මුද්‍රණාලය සහ එහි සේවය කරන අයගේ පවුල්වල සාමාජිකයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:21-** ශුද්ධාත්ම වර්ෂාවක ආශිර්වාද ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:22-** පාස්ටර් සෑම් සෙල්වරාජ්ගේ දේශීය සහ විදේශීය සේවා ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:23-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඉදිරිපත් කරන YouTube ජාලයේ වැඩසටහන ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:24-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලේ සහ නෙහෙමියා බයිබල් විදුහලේ සෑම ක්‍රියාකාරකම් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:25-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලේ 10 වසර සිසුන්ගේ විභාගය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:26-** කැඳවීමේ ප්‍රතිරාවය සේවය සඳහා ක්‍රියාකාරී සේවකයන් ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:27-** සියලුම සහකාර කතෘවරුන් සහ ඔවුන්ගේ පවුල් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:28-** නෙහෙමියා බයිබල් විදුහලේ ආරම්භ කිරීමට අදහස් කරන BTH උපාධිය ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:29-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහල, නෙහෙමියා බයිබල් විදුහල සහ දේවධර්ම පාඨමාලාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:30-** දේව සේවය උදෙසා දේශයේ සංචාර කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**2023 මැයි මාසය**

**මැයි:01-** කැඳවීමේ ප්‍රතිරාවය සංවිධානයේ සියලුම සේවක පවුල් ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මැයි:02-** පාස්ටර් සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු දුෂ්ට බලවේග වලින් ආරක්ෂා වීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

**මැයි:03-** ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලේ රිදී ජුබිලිය පැවැත්වීමට නියමිත වීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**මැයි:04-** දීර්ඝ කාලීනව රෝගාතුරුව සිටින අය උදෙසා යාච්ඤා කරන්න.

**මැයි:05-** කැඳවීමේ ප්‍රතිරාවය YouTube සමාජ ජාලයට අලුත් ග්‍රාහකයක් එකතුවීම ගැන යාච්ඤා කරන්න.

**මැයි:06-** උතුරු ඉන්දියාවේ සිටින මිෂනාරිවරුන් ගැන යාච්ඤා කරන්න.

**මැයි:07-** මිෂනාරිවරුන් සහ දේව සේවකයන් වෙත එල්ලවන කුරිරුකම් සහ ප්‍රචණ්ඩත්වය ගැන යාච්ඤා කරන්න.

**මැයි:08-** කැඳවීමේ ප්‍රතිරාවය නිර්මාතෘ සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය ගැන යාච්ඤා කරන්න.

**මැයි:09-** ජූනි 03 වන දින පැවැත්වීමට නියමිත නෙහෙමියා බයිබල් විදුහලේ උපාධි ප්‍රදානෝත්සවය ගැන යාච්ඤා කරන්න.

**මැයි:10-** සෑම කිතුණු සභාවකම අලුත් ආත්ම ගැලවීම ලැබීම ගැන යාච්ඤා කරන්න.

**මැයි:11-** මෑතකදි තුර්කියේ භූමිකම්පාව නිසා මනුෂ්‍යයන්ගේ දේපල හානිවීම තුළින් ඇතිවී තිබෙන පීඩනයෙන් ඔවුන් නිදහස් වන පිනිස යාච්ඤා කරන්න.

**මැයි:12-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ මුද්‍රණාලයේ වැඩකටයුතු ගැන යාච්ඤා කරන්න.

**මැයි:13-** දේව සේවයේ මූල්‍යමය අවශ්‍යතා ගැන යාච්ඤා කරන්න.

**මැයි:14-** නෙහෙමියා බයිබල් විදුහලේ පැවැත්වීමට නියමිත BTH උපාධිය සඳහා ඉගැන්වීම් සඳහා සිසුන් ලියාපදිංචි වීම ගැන යාච්ඤා කරන්න.

**මැයි:15-** (2023 - 2024) අධ්‍යනය වර්ෂ සඳහා ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලට සිසුන් ලියාපදිංචි වීම ගැන යාච්ඤා කරන්න.

**මැයි:16-** (2023 - 2024) අධ්‍යනය වර්ෂ සඳහා නෙහෙමියා බයිබල් විදුහලට සිසුන් ලියාපදංචි වීම ගැන යාච්ඤා කරන්න.

**මැයි:17-** කැඳවීමේ ප්‍රතිරාවය කාර්යය මණ්ඩලය එකමුතුව ගැන යාච්ඤා කරන්න.

**මැයි:18-** කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සහකාර කතෘවරුන් ගැන යාච්ඤා කරන්න.

*4 පිටුවෙන්....*

පවසනු ලැබීය. ඔබගේ පණිවිඩය තුළින් ඔවුන් ක්‍රිස්තුස්වහන්සේව පිළිගැනීමටත් උන්වහන්සේගේ ක්‍රියාවන් ගැනත් දේශනා කරන්නය කියා පැවසීය. මා ඔවුන්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන හා උන්වහන්සේගේ ශුභාරංචිය ගැන කථා කලෙමි. එහි ප්‍රතිඵලයක් ලෙස විශාල සෙනඟක් පසුතැවිලි වී කඳුළු සමඟ යේසුස්වහන්සේව ඔවුන්ගේ පුද්ගලික ගැළවුම්කරු ලෙස පිළිගත්තේය. එය ඉතා අනර්ඝ වූ සිදුවීමකි.

මේ ජාතිය පසුබට වූයේ ඇයි? මන්ද ඔවුන්ගේ කුළුඳුල් ප්‍රේමය අත්හැර ඇත. ලෝකයේ ප්‍රඥාව ආර්ථික වර්ධනය විනෝදකාරී ජීවිතය, මත්ද්‍රව්‍ය ආදී දේ නිසා ඔවුන්ගේ මනස යාච්ඤාවේ ජීවිතයෙන් වෙන්කර වැරදි දිශාවකට යොමු වී ඇත. ඔවුන්ගේ ජීවිතයේ ශුද්ධකම නැතිකරගෙන ඇත.

**අප කොරියා දේශය ගැන බලමු,**

කොරියා දේශයේ ආර්ථිකය, අධ්‍යාපනය හා සංස්කෘතිය යන අංශයන් හි වැටීමක් තිබූ කාල වකවානුවේදී පෝල් යොංගිචෝ නැමති මනුෂ්‍යාව දෙවියන්වහන්සේව නැගිට්ටෙව්වේය. දෙවියන්වහන්සේ ඔහුගේ යාච්ඤාවට පිළිතුරු දෙමින් මහත් පිබිදීමක් එව්වේය. මේ පිබිදීම කරණකොටගෙන මේ ජාතිය ආර්ථිකව හා මානසික මට්ටමින්ද හා අධ්‍යාපනය තුළින් ලෝකයේ ඉතා දියුණුම තත්වයකට පත්විය.

මෙම දෙවියන්වහන්සේගේ දාසයාත් දෙවියන්වහන්සේගේ සෙනඟත් දිගටම යාච්ඤා කිරීම අත්නොහැරිය අතර ශුද්ධ ජීවිතයක්ද ගත කරනු ලැබීය. දේවස්ථාන තුළ සෑම දිනකම යාච්ඤාවන් වැඩි කර තිබේ. රෑ දාවල් යාච්ඤාකරන පිණිස බොහෝ යාච්ඤා මධ්‍යස්ථාන විවෘත කරනු ලැබීය. මේ නොකඩවාම කරනු ලබන යාච්ඤාව කරණකොටගෙන පිබිදීමද දිගටම සිදු විය. මේ දේශයේ දේව දාසයෝ කුළුඳුල් ප්‍රේමය අත්හැරියේ නැත. යාච්ඤාවට තිබෙන පිපාසය අත් හැරියේ නැත. මේ නිසා අද කොරියාව ඉතා දියුණු රටක් බවට පත්වී ඇත. මා කතා කරන්නේ දකුණු කොරියව ගැනය. අද මේ දේශයේ මනුෂ්‍යයන් ලෝකය පුරාම ගොස් පිබිදීමේ හවුල්කරුවෝ වී ඇත.

මේ පිබිදීම දිගටම පවත්වාගෙන යාමට නම් අපගේ ජීවිතයේ යාච්ඤාව නොකඩවාම පැවැත්විය යුතුයි. දෙවියන්වහන්සේගේ අල්තාරයේ ශුද්ධවූ ගින්න නොනිවී තබාගන්නා පිණිස එය රැකගත යුතුයි.

## අව්‍යංක පිබිදීම පැති දෙකකි

1. **දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් අතරේ සජීවී පිබිදීමක්**
2. **දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය නැවත ප්‍රතිස්ථාපනය කිරීම.**

## (1). දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් අතරේ සජීවී පිබිදීමක්

නොකඩවා යාච්ඤාව පිබිදීම ගෙනෙනවා ඇත. ශුද්ධවූ පාවුළුතුමා මෙසේ ලියනු ලබයි. ***"එබැවින් සහෝදරයෙනි, නුඹලාගේ ශරීරයේන් ජීවමානවූ, ශුද්ධවූ, දෙවියන්වහන්සේ විසින් පිළිගත හැකිවූ යාගයක් කොට ඔප්පු කරන හැටියට දෙවියන්වහන්සේගේ දයාවන් නිසා නුඹලාගෙන් ඉල්ලමි, එය නුඹලාගෙන් ආත්මික සේවය වේ...., සිත අලුත්කරගැනීමෙන් අන්‍යාකාර ඇත්තෝ වෙයල්ලා." (රෝම 12:1-2)*** මේ දිනවල සභාවන් වලත් කිතුණු සංවිධාන වලත් අපෝස්තලික ආත්මික අත්දැකීමකට මුල්තැන දෙමින් ගමන්කරනු ඇත. වර්තමානයේදී නිරාහාර යාච්ඤාව වෙනුවට මුදල් උපයන්නාවූ ක්‍රම සහ විධි සොයමින් ක්‍රියාකරනු ඇත. යාච්ඤා රැස්වීම් වලට පැමිණෙන්නාවූ අය ඔවුන්ගේ

දේශය වෙනුවෙන් යාච්ඤා කරන විටදී තමාව යටත් කරමින් නොකඩවාම යාච්ඤා කිරීම තුල ඔවුන්ගේ යාච්ඤාවට දෙවියන්වහන්සේ ගේ පිළිතුරු දෙන තුරාම යාච්ඤා කල යුතුය. එසේම යාච්ඤාව කරණකොටගන ධාමරික ක්‍රියාවන් අපරාධ ක්‍රියා සහ ශාපයන් සම්පූර්ණයෙන්ම දේශයෙන් ඉවත් වෙන්නය කියා නොකඩවාම යාච්ඤා කල යුතුය. අපගේ ජාතියට අවංක ආත්මික පිබිදීමක් අවශ්‍ය නම්, දෙවියන්වහන්සේගේ දරුවන් පළමු කොට දේව කැමැත්තට තමාගේ මනස අලුත් කරමින් ඉඩදිය යුතුය. අද සභාවන් වල යම්කිසි අලුත් දෙයක් අල්ලාගෙන මහත් පිබිදීමක් ගැන කතා කරයි. එහෙත් මනුෂ්‍ය ජීවිත වල සැබෑ වෙනස්වීමත් නොකඩවා යාච්ඤා කිරීමටත් අමතක කර දමා සංගීතය නැටුම් ඇතුලු ආශිර්වාදය පමණක් ගැන දේශනා කරමින් මනුෂ්‍යයන්ව ඇදගන්නාවූ වේදිකාවන් වැනි අත්‍යවශ්‍ය දේ වලට මුල් තැන දෙනු ලබයි. අද දේව දාසයින් අතරේ පවා මුදල් වලට ආශාව, උඩගුකම, ආත්මාර්ථකාමීකම නපුරු ක්‍රියාවන් වැනි දේ පමණක් නොව දේව රාජ්‍යයේ සංකල්පයන් අමතක කර දමා මගේ සභාව, මගේ සේවය, මගේ ධර්මදූත සේවය, මගේ කුළුණ, මගේ උයන යන මෙවැනි බොහෝ දේවල් ප්‍රකාශ කරමින් තමා ගැනම පාරට්ටු කරගෙන දෙවියන්වහන්සේගේ කාරණාවන්ට මුල්තැන නොදී ක්‍රියා කරනු ලබයි. මෙවැනි දේ තුළින් දෙවියන්වහන්සේගේ පිබිදීමක් බලාපොරොත්තු විය නොහැකිය. දේව පිබිදීම නම් අපගේ ජීවිතයේ පවිත්‍ර කම කරණකොටගෙනත්, යාච්ඤාව කරණකොට ගෙනත් දිනපතාම මනුෂ්‍යයන් අතරට යාමයි.

## (2). දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය නැවත ප්‍රතිස්ථාපනය කිරීම

පසුගිය වසර තිහ තුලදී බොහෝ දේව දාසයින් නැගිට සිටි අතර බොහෝ සේවාවන්ද වැඩිවී තිබේ. නමුත් යහපත් ආකල්පයන් අඩුවෙමින් කැලඹිලි සහිත බව හා නපුරු සිතුවිලි වැඩිවී තිබේ. තවද සභාවන් තුළත් කණ්ඩායම් තුලත් එක්තරා දෙයක් නිසාම වසර ගණනාවක් පුරාම යාච්ඤා කිරීම පුරුද්දක් බවට පත් වී තිබේ. තවත් සමහර ආත්මික තෘප්තියක් නොමැතිකම නිසා සභාවෙන් සභාවට මාරු වෙති. තවත් සභාවන් ලෝකාකාර ක්‍රම සහ විධි ඉදිරියේ වෙව්ලති. ශක්තිමත්කම නොමැතිව වෙව්ලති.

දෙවියන්වහන්සේගේ දාසයින්ගේ බලවත් දේශනා තුළින්, යක්ෂයාව පරාජයට පත්කර මනුෂ්‍යය ජීවිතවල වෙනස්වීමක් ඇතිකල යුතුය. නමුත් අද ඒවා සිදුවන්නේ නැත. සේවයේ තිබූ මහිමය අහිමිවී ඇත. මේවා සිදුවන්නෙ ඇයි? එයට හේතුව නම් දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයෙන් ඈත්ව සිටීමයි.

එසේනම් දේව අභිමුඛත්වය අපගෙන් නැති වූයේ කුමන ස්ථානයෙන්ද කියා සොයා බලා අපගෙන් අහිමිවූ අපෝස්තලික ආලේපය ගැන අප තේරුම්ගෙන යාච්ඤාව කරණකොටගෙන එම ආලේපය සභාව තුළත් පවුල තුළත් වැගිරෙන පිණිස ආශාවෙන් බලා සිටිය යුතුය. මේ දේ සිදුවෙනවා නම් මනුෂ්‍යයන්ගේ පිබිදීම ගැන හඬා වැලපෙනු ඇත. ආත්ම බරක් නොමැති අපට ආත්ම බරක් ඇති වෙයි. ඔවුන් ඕනෑම පූජාවක් කිරීමට සූදානම් වෙයි.

මන්ද ඔවුන්ගේ ජීවිතය දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය තුල ගොඩනැගුන විටදී මෙලෙස සිදුවෙනු ඇත.

*10 වෙනි පිටුවට....*



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට


**"...කියවන්නා තේරුම් ගනීවා...."** *(මතෙව් 24:15)*

## කැඳවීමේ ප්‍රතිරාවය මුද්‍රණාලය

## THE PRINTING PRESS OF ECHO OF HIS CALL!

1969 වර්ෂයේ සිට 1971 වන වර්ෂය දක්වා කාල වකවානුව තුළදී මා එක්තරා දේව දාසයෙක් යටතේ එනම් පාස්ටර් එස්. දේවදාසන් සමඟ ඔහුගේ කාර්යාලයේ තරුණයෙක් ලෙස සේවය කලෙමි. ඔහු විසින් මුද්‍රණය කරනු ලැබූ ''පෙරමග දූතයා'' යන සඟරාව මුද්‍රණය කරනු ලැබූ මුද්‍රණාලයෙහි මා සේවය කලෙමි.

දෙවියන්වහන්සේගේ සේවය තුළ තිබෙන්නාවූ අමාරුකම් භක්තිවන්තකම් සහ සේවය කරනු ලැබූ ක්‍රම සහ විධි, කාර්යාලයේ වැඩකටයුතු, පරිපාලනය සම්බන්ධ




*Manual Printing Machine*

කටයුතු යන මේ සියලුම කාරණාවන් ඔහුගේ නායකත්වය යටතේ මා ඉගෙන ගැනීමටත් එවකට එම ස්ථානයෙහි මුදල් පරිපාලන කටයුතු වල නියැලී සිටි වේදමනි යන තැනැත්තා තුළින් ඒ සම්බන්ධ දැනුමද ලබාගැනීමට අවස්ථාවක් ලැබුණි.

මෙම පාලකතුමා අලුත් මුද්‍රණාලයක් මිලදී ගත්තේය. එහි තිබුනේ එක් මුද්‍රණ යන්ත්‍රයක් පමණි. එය ඉතා පැරණි එකක් බැවින් එයින් මුද්‍රණ කටයුතු කිරීමේදී මහත් අසීරුතාවයන්ට මුහුණදීමට සිදුවුනි.

මෙම මුද්‍රණ යන්ත්‍රයෙන් මසකට පත්‍රිකා 50,000 ක් මුද්‍රණය කල අතර ලීවරය අල්ලා කැරකිය යුතුය. මෙසේ පත්‍රිකා මුද්‍රණයට වාර 50,000 ක් ලීවරය කරකවන විටදී ඒ හැම වාරයකදීම මා ''ස්වාමීන්වහන්සේට ප්‍රශංසා වේවා'' කියා පැවසුවෙමි.




මෙය දුටු මගේ පාලක තුමා ඉතා ධෛර්යයමත් විය. එසේම ඔහු පාලයම්කෝට්ටෛයි යන ස්ථානයට ගොස් 'නිව් ලයිෆ්' යන පත්‍රිකාව මුද්‍රණය කරනු කියා පවසනු ලැබීය. මෙම පැරණි මුද්‍රණාලයට ගිය මා හට දැකීමට හැකි වූයේ එහි සිටි මනුෂ්‍යයන් වාඩිවී මුද්‍රණය කරනු ලැබූ පත්‍රිකා එකිනෙක නමා මිටි බැද තැපැල් කාර්යාලයයට ගෙන යන ආකාරයයි. එය දුටු විට මෙවැනි සේවයක් කිරීමට මගේ හදවතෙහි මහත් ආශාවක් ඇති විය. එම අවස්ථාවේ සිටම ශුභාරංචි පත්‍රිකා මුද්‍රණය කර




*Present Automatic offset Printing Machine*

අන් අයට බෙදා දීමට අවශ්‍යයි යන ආශාව ඇති වූ විට මා ඒ සම්බන්ධව බොහෝ තොරතුරු විවිධ අයගෙන් අසා දැනගතිමි.

දිනක් මා යම් ස්ථානයකට ගිය විටදී එහි සිටි දේව දාසයෙකුට අයිති Off-Set මුද්‍රණය කරනු ලබන යන්ත්‍ර 100ක් එක් පෙළට තබා තිබූ ආකාරය මා දිටිමි. මෙම යන්ත්‍රයක මිල කොපමණද? කියා මා ඔහුගෙන් ඇසූ විටදී එහි වටිනාකම මා හට පවසා 'මෙය මිලදී ගැනීමට හැකි වන්නේ මුදල් තිබෙන අයට පමණි. ඔබට නම් මෙය මිලදී ගැනීමට බැරිය. කවුරුන් හෝ ඔබට මෙය තෑග්ගක් ලෙස ලබා දුන්නද එය නඩත්තු කිරීමට ඔබට බැරිය.' කියා පවසනු ලැබීය. එය ඇසූ මගේ හදවත කඩා වැටුනි. නැවත මා සිටි ස්ථානයට ගොස් දණින් හිද යාච්ඤා කලෙමි.

ස්වාමීන්වහන්සේ මගේ යාච්ඤාවට පිළිතුරු දුන්නේය. මා හට පැරණි මුද්‍රණ යන්ත්‍රයක් ලබා දුන් අතර එවැනි යන්ත්‍රයක් තිබුනේ දකුණු අප්‍රිකාවේය. දෙවියන්වහන්සේ මෙම පැරණි මැෂිම මට ලබා දුන්නේය. එය චෙන්නෙයි වල සිටි සහෝදර සුන්දරම් යන පුද්ගලයෙකු ළඟ තිබුණි. ඔහුට එය පාවිච්චි කිරීමට නොහැකි නිසා ඉතා අඩු මුදලකට මා හට ලබා දුන්නේය. ඉන් පසුව මාගේ ශුභාරංචි පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරීමේ සේවයට දෙවියන්වහන්සේ ආශිර්වාද කලේය. අද දෙවියන්වහන්සේ කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව මුද්‍රණය කිරීමට ස්වයංක්‍රිය මුද්‍රණ යන්ත්‍රයක් මා හට දී තිබේ. ඒ යන්ත්‍රය තුලින් අප භාෂා 16 කින් කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව මුද්‍රණය කරනවා පමණක් නොව විවිධ භාෂාවන් වලින් ආත්මික පොත් ගණනාවක්ද මුද්‍රණය කරමු. අප මුළු ලෝකයටම මෙම සඟරාව බෙදා හරනු ලබන්නේ කිසිදු මුදලක් අය නොකරය.

මා මෙවැනි තත්වයට එන පිණිස බොහෝ අමාරුකම් තුලින් ගමන් කළෙමුව. ප්‍රිය මිත්‍රය, ඔබත් අමාරුකම් තුලින් ගමන් කරනවාද? ස්වාමීවූ යේසුස්වහන්සේ ඔබට දුන් සේවය ඉදිරියටම කරගෙන යාමට සියලු උපකාරය ඔබට දෙන සේක. අධෛර්‍යය නොවන්න.

***' '....දෙවියන්වහන්සේ විසින් තමන් ප්‍රේමකරනන්ට සූදානම්කල යම් දෙයක් ඇත්ද ඒ දේ ඇසට නොපෙනුණේය. කනට නොඇසුණේය, මනුෂ්‍යයාගේ සිතට නොපැමින්නේය...'' (1 කොරින්ති 2:9)*** ***

1. අපගේ ප්‍රධාන පාලකතුමාගේ පවුල මුහුණ දෙනු ලබන ප්‍රශ්න වලට ස්වාමීන්වහන්සේ විසඳුමක් ලබා දෙන්න කියා
2. කැඳවීමේ ප්‍රතිරාවය සේවයට තිබෙන සියලුම ආර්ථික අවශ්‍යතා නිසා
3. දේව දර්ශනය ඇති මනුෂ්‍යයන් සේවය සඳහා ලබා දෙන්න කියාත් අපගේ චෙන්නෙයි කාර්‍යාලයට කැපවූ සේවකයන් අවශ්‍යය වෙයි. එසේම අපගේ බයිබල් පාසලටත් මුද්‍රණාලයටත් සභාවන් වලටත් ධර්මදූත සේවය කරන්නාවූ ස්ථාන වලටත් කැපවී සේවය කරන්නාවූ අය අවශ්‍ය වෙයි.
4. දෙවියන්වහන්සේගේ සේවයට බාධා කරන්නාවූ සියලු දෙනාම ගැලවීම ලබන පිණිස
5. සෑම පාලකවරයෙක්ම ඔවුන් ගැන පමණක් නොසිතා ඔවුන්ට තිබෙන සියලුම සැප පහසුකම්, සභාවන් ගොඩනැගීමටත්, ගම්බද සේවයටත්, සභාවන් නොමැති ස්ථාන වල සභාවන් බිහි කිරීමටත් පාවිච්චි කරන්නය කියා යාච්ඤා කරන්න. එක්තරා දේව මනුෂ්‍යයෙක් මෙසේ පැවසීය. ''සමහර දේව දාසයින් අතේ තිබෙන මුදල් ඔවුන් නිදහස් කලා නම් ඉන්දියාව තුළ සභාවන් බිහි කිරීමට පුළුවනි'' කියා. කරුණාකර මේ ගැන යාච්ඤා කරන්න.

7 පිටුවෙන්....

මේ ලෝකයේ මෙවැනි කාල වකවානුවක් තුළදී දෙවියන්වහන්සේ අපව මේ ලෝකයෙහි ජීවත්ව තබා තිබෙන්නේ අපගේ සියලුම මලානික ක්‍රියාවන් අත්හැර ආත්මාර්ථකාමී ක්‍රියාවන් අත්හැර දේව අභිමුඛත්වයට පැමිණ මහත්වූ පිබිදීමේ අස්වැන්න නෙලාගැනීමටය. මෙයයි කාලය, මෙයයි පිබිදීම අත්දැකිය යුතු කාලය, එබැවින් ඔබ ක්‍රියා කරන්න, දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරනු ඇත.

************

*(ගීතාවලිය 121:7-8)*

*"ස්වාමීන්වහන්සේ සියලු නපුරෙන් නුඹ ආරක්ෂා කරනසේක, නුඹේ ප්‍රාණය ආරක්ෂා කරනසේක, දැන් පටන් සදාකාලේටම ස්වාමීන්වහන්සේ නුඹේ යාම් ඊම් ආරක්ෂා කරන සේක."*

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 3rd APRIL 2023.
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
P.O. Box No. 2957,
Chepauk, Chennai - 600 005, INDIA.
Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766

**JESUS LOVES YOU!**

To

GOD BLESS YOU!

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**